ජනතා වතු සංවර්ධන මණ්ඩලය - 2021

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 වියාචනය කළ මතය

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සහ එහි පරිපාලිතයන්ගේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත, 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 මතය වියාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ වියාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මණ්ඩලය විසින් බදු පදනම මත ලබා දී ඇති හෙක්ටයාර 123,306.37 ක් ඇතුළත්ව මණ්ඩලය සතු මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 142,592.27 ක් වුවත් මෙම ඉඩම්වල වටිනාකම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 40 හි 34 ඡේදය ප්‍රකාරව තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන තුළ දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි. තවද හෙක්ටයාර 2,872.45ක ඉඩම් ප්‍රමාණයක් මණ්ඩලය විසින් 2025 මාර්තු 25 දින වන විටත් නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි.	ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වතු රේඛීය අමාත්‍යාංශ අනුග්‍රහය යටතේ මිනුම් කටයුතු කරමින් පවතින අතර හෙක්ටයාර 2803ක් වූ වතුයායන් 04ක මැනුම් කටයුතු සඳහා රේඛීය අමාත්‍යාංශය මගින් මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇති අතර, ඉඩම් අංශයෙන් ලද තොරතුරු අනුව එම ඉඩම් මේ වනවිට මැනුම් කටයුතු සිදුකර අවසන් වී ඇතත් රේඛීය අමාත්‍යාංශය මගින් මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත ගෙවීම් කර නොමැති බැවින් එම පිඹුරුපත් වාර්තා ලබාගැනිමට තවම නොහැකි වී ඇත.	ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ඉඩම්වල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන තුළ දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු අතර, හඳුනා නොගත් ඉඩම් හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය අනුව දේපල පිරියත හා උපකරණවල සුන්බුන් වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකදීම සමාලෝචනය කර නැවත තක්සේරු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අවසාන වන විට තවදුරටත් භාවිතා කරමින් පවතින සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වටිනාකම රු.503,460,537ක් දේපල පිරියත හා උපකරණ පිරිවැය සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	මෙම වත්කම්වල අවශේෂ හා ඵලදායී ජීව කාලය නැවත තක්සේරු ලබාගැනීම සඳහා කමිටුවක් පත්කර එම කමිටුව සඳහා තක්සේරු නිලධාරින් තෝරා පත් කර ගැනිම සඳහා ප්‍රසම්පාදන අංශය වෙත යොමු කර ඇත. එම ක්‍රියාවලිය සිදුවීමෙන් අනතුරුව අදාළ තක්සේරු අගයන් ගිණුම් වලට ගැනිමට කටයුතු කරනු ඇත.	ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ නැවත භාවිතා කරන වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 55 ඡේදය ප්‍රකාරව හා මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති 3.2.3 ප්‍රකාරව වත්කම් පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසු එම වත්කම ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුවද, 2021 වර්ෂය තුළදී වතුයායන් සහ ප්‍රධාන කාර්යාලය විසින් මිලදී ගන්නා ලද	ප්‍රධාන කාර්යාලයේ 2022 වර්ෂයේ මිලදී ගත් දිනයේ සිට නිවැරදිව ක්ෂය කිරීම සිදුකර ඇති අතර, 2021 වර්ෂයේ මිලදී ගත් වර්ෂයටම කළ ක්ෂය කිරීම 2022 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. වතු අංශයද 2021 වර්ෂයේ සිටම නිවැරදිව මිලදී ගත් දිනයේ සිට ක්ෂය	ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව වත්කම් එම වත්කම් භාවිත තත්ත්වයට ගෙන ආ දින සිට ක්ෂය කිරීමට කටයුතු කළ යුතුය.

	රු.22,393,425ක් වූ ස්ථාවර වත්කම් මිලදී ගත් දිනය නොසලකා සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කර තිබුණි.	කිරිම සිදුකර ඇත.	
(ඇ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 හි 50 වන ඡේදය ප්‍රකාරව අස්ථිත්වයේ සේවා ප්‍රතිලාභ බැඳීම ගණනයේදී ආයුගණන ක්‍රමය යොදාගෙන ගණනය කිරීම කළ යුතු වුවද, මණ්ඩලය විසින් ප්‍රතිලාභ ගණනයේදී සේවකයකුගේ වර්ෂ අවසානයේ ලබන මූලික වැටුප පමණක් පදනම් කරගෙන සේවා ප්‍රතිලාභ ගණනය කර තිබුණි.	ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් පාරිතෝෂික ගණනය කිරීම පෙර සිටම 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත අනුව සිදුකර ඇත. කම්කරු දෙපාර්තමේන්තුව විසින් පාරිතෝෂික හිඟ ගෙවීම් සම්බන්ධව කටයුතු සිදුකරනු ලබන්නේ මෙම පනතට අනුව බවද සඳහන් කරමි. 2024.06.10 දින පැවති විගණන කළමණාකරන කමිටුවේදිද පාරිතෝෂික පනතට අනුව කටයුතු කිරිම නිවැරදි බව සඳහන් කර ඇත. තවද 2020 /2021 මූල්‍ය ප්‍රකාශනයන් වල ප්‍රතිපත්ති ලෙස හෙළිදරවු කර ඇත්තේද පාරිතෝෂික පනත අනුව කටයුතු කරන බවය.	ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ආයු ගණන ක්‍රමය සේවා ප්‍රතිලාභ ගණනය කිරීමට වඩා ඵලදායී ක්‍රමයක් වන බැවින් ඒ අනුව කටයුතු කළ යුතුය.
(ඉ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 41 හි 12 ඡේදය ප්‍රකාරව රු.40,769,359ක් වූ පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් වටිනාකම වාර්ෂිකව තක්සේරු නොකර ස්ථාවර අගයක් ලෙස ඉදිරියට ගෙන එමින් පැවතුණි.එසේම එම ශේෂය සත්‍යාපනය කර ගැනීම සඳහා වාර්ෂිකව යාවත්කාලීන කරන ලද ගස් සංගණන හා තක්සේරු වාර්තාද විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී විකුණු පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් වල විකුණුම් ආදායම රු.131,963,104 ක් වුවද ගස්වලට අදාල පිරිවැය වත්කම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම 54 (ඇ) ඡේදය ප්‍රකාරව රු.9,052,059ක් වූ වෙනත් ජීව විද්‍යාත්මක වත්කම්වල ක්ෂය ගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.	2022, 2023, 2024 වර්ෂවල තක්සේරු වාර්තා වන සම්පත් අංශය විසින් ලබාගෙන ඇත. ඒ අනුව 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් සටහන් මගින් අනාවරණය කර ඇති පරිදි 2024 වර්ෂයේදී ගිණුම මගින් අවශ්‍ය ගැලපීම් සිදුකර ඉදිරිපත් කිරිමට කටයුතු කර ඇත. එමෙන්ම මෙම රු. 7,216,118 වූ ජීව විද්‍යාත්මක වත්කම්වල ශේෂය දිගින් දිගටම පැවැත එන ශේෂයන් වන අතර, එහි නිවැරදිභාවය සොයා බලා ඉදිරියේදි සුදුසු පියවර ගැනිමට කටයුතු කරනු ඇත. ක්ෂය අනුපාත හා පරිණත කාලය හෙළිදරවු කර නොතිබුණු කරාබුනැටි හා කෝපි වගාවන්ට අදාළ තොරතුරු 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් මගින් හෙළිදරවු කිරිමට කටයුතු කර ඇත.	ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ජීව විද්‍යාත්මක වත්කම් තක්සේරු කර ගිණුම්ගත කර ක්ෂය කළ යුතුය. විකුණූ ගස්වල පිරිවැය නිවැරදිව ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මොන්තක්‍රිස්තෝ වතුයාය 2003 වර්ෂයේ සිට විවිධ පාර්ශව වෙත බදු දී තිබෙන අතර මෙම වතුයායේ දේපල පිරියත හා උපකරණ ශේෂය සහ ජීව විද්‍යාත්මක වත්කම්වල පිරිවැය මූල්‍ය ප්‍රකාශන අනුව	මෙම මොන්තක්‍රිස්ටෝ වතුයායේ වත්කම් වලට අදාළව ලිපි ලේඛන නොමැති බැවින් මෙම වත්කම් ක්ෂය කිරිම සිදුකර නොමැත.	මූල්‍ය ප්‍රකාශන අනුව පැවැති වත්කම් ශේෂය භෞතිකව පරීක්ෂා කර තහවුරු කිරීමට කටයුතු කළ යුතුය.

	රු.32,168,955ක් විය. මෙයට අදාලව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර වත්කම් සම්බන්ධයෙන් භෞතික පරීක්ෂාවක්ද මණ්ඩලය විසින් සිදු කර නොතිබුණු බැවින් එම වත්කම්වල අගය හා පැවැත්ම විගණනයට තහවුරු කර ගැනීමට නොහැකි විය.		
(ආ)	දේපල පිරියත හා උපකරන වටිනාකම තුළ දක්වා ඇති රු.39,287,968ක් වූ කෙරී ගෙන යන වැඩ ශේෂය තුළ කෙරී ගෙන යන වැඩ ලෙස හඳුනාගත නොහැකි පරිත්‍යාග සහ මුරකරුවකුගේ වැටුප් වශයෙන් ගෙවා තිබුණු රු.5,129,989ක වියදම්ද ඇතුළත්ව තිබුණි.	මෙම කෙරීගෙන යන වැඩ සම්බන්ධ විස්තර වතුයායන් වල පවතින අතර එම තොරතුරු ප්‍රධාන කාර්යාලය විසින් වතු වෙතින් ඉල්ලුම් කලද තවමත් ඔවුන් විසින් පිළිතුරු ලබා දී නොමැත. එම නිසා මෙම වියදම් සම්බන්ධ තොරතුරු අදාල වතුයායන්ගෙන් ලබාගෙන විශ්ලේෂණය කිරීමට කටයුතු කරනු ඇත.	වතුයායන් විසින් කෙරීගෙන යන වැඩ නිවැරදිව හඳුනා ගැනීමට හා එයට ඇතුළත් හඳුනාගත නොහැකි වියදම් ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.

1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේදී කල්බදු පදනම යටතේ ලබාගෙන තිබුණු රු.6,150,000ක් පිරිවැය වූ ට්‍රැක්ටර් රථ 03ක කල්බදු වගකීම ලෙස 2021 වර්ෂයට අදාලව රු.3,101,640ක් මූල්‍ය ප්‍රකාශනය තුළ හඳුනාගත යුතු වුවද, මණ්ඩලය විසින් රු.5,452,725ක් හඳුනා ගැනීම හේතුවෙන් කල්බදු වගකීම රු.2,351,085කින් අධිගණනයවී තිබුණි.	වර්තමානයේ කල්බදු ණයහිමි ගිණුමේ ශේෂය තුල කල්බදු ගිවිසුමට අනුව කල්බදුකරු වෙත ගෙවිය යුතු මුළු පොළිය හා වත්කමේ පිරිවැය යන දෙකම සදහන් කර ඇති නමුත් LKAS 17 කල්බදු ප්‍රමිති ප්‍රකාරව 2024 වර්ෂයේදි අවශ්‍ය ගැලපිම් කිරිමට කටයුතු කරනු ඇත.	ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කල්බදු වගකීම් නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	2010 වර්ෂයේදී වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කළ වතු සංවර්ධන ව්‍යාපෘතියට අදාලව සෙවිලි තහඩු මිලදී ගැනීම සඳහා ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් වැය කරන ලද රු.4,136,733ක් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළ වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂයක් ලෙස වර්ෂ 10 කට අධික කාලයක් අය නොවී පවතින බව නිරීක්ෂණය වුවද ඊට අනුකූලව අවශ්‍ය වෙන්කිරීම් මූල්‍ය ප්‍රකාශවල සිදු කර නොතිබුණි.	මෙම ව්‍යාපෘති 2010 දී අවසන් වී ඇති අතර, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අනුග්‍රහය මත තිබූ මෙම ව්‍යාපෘතිය සිදුකල ආයතනය මගින් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට මෙම ශේෂය අයවිය යුතු වුවත්, එම ආයතනයද දැනට ක්‍රියාත්මක නොවන නොපවතින ආයතනයක් වන බැවින් මේ සම්බන්ධව තව දුරටත් කරුණු සොයා බැලීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සිදුකරනු ඇත.මීට අමරතව ආයතනය සඳහා බොල් ණය හා අඩමාණ ණය ප්‍රතිපත්තියක් සකස් කිරිම සඳහා 2025 වර්ෂයේදි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනිමට කටයුතු කරනු ඇත.	වසර දහයකට වඩා වැඩි කාලයක සිට පවතින මණ්ඩලයට ලැබිය යුතු මෙම ශේෂය හැකි ඉක්මනින් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි.

(ඇ)	සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් පරිණත කාලය ඉක්මවූ රු.10,000,918ක් වූ වගාවන් පරිණත වගාවට මාරු නොකර නොමේරු භෝග යටතේ දක්වා තිබුණි.	මෙම ශේෂයන් පැරණි ශේෂයන් වන අතර, මෙම නොමේරු භෝග ශේෂ තුළ ඇති රු.10,000,918ක් භෝග භෞතික පැවැත්ම හා අවශ්‍ය තොරතුරු සොයා බලා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත.	වගාවන්ගේ පරිණත කාලය හඳුනාගෙන නිවැරදිව ගිණුම්වලට ගැලපීම් කළ යුතුය.
(ඈ)	2021 දෙසැම්බර් 31 දිනට පාරිභෝජ්‍ය අංශයේ පැවති රු.2,744,595 ක තොග ශේෂය තුළ ඇතුළත් රු.2,369,453ක් වූ තේ තොගය භෞතිකව නොමැති වුවද තොගයෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම වතුයායන් 11කට අදාලව රු.2,761,476ක තොග ශේෂය භෞතිකව නොපැවතිය ද මූල්‍ය ප්‍රකාශන තුළ තොග වටිනාකම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි.	රු.2,369,453 ශේෂය 2019 වර්ෂයේ යල් පැන ගිය තේ තොගයේ වටිනාකම නොවන අතර, එය පෙර වර්ෂවල සිට ඉදිරියට ගෙන ආ ශේෂයකි. පාරිභෝගික අංශය විසින් මෙම යල් පැන ගිය හා යල් පැනීමට ආසන්න තේ තොග නැවත භාවිතයට ගත හැකි තත්වයේ තොග බවට පත්කිරීම refire ක්‍රියාවලියට ලක් කිරීම සඳහා වතු වෙත ආපසු යවන අතර, එම ක්‍රියාවලියට ලක් කිරීමෙන් පසු නැවත මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගෙන අළෙවි කිරීම සිදු කරනු ලබන බව පාරිභොගික අංශය විසින් දැණුම් දුන් නමුත් එම තොගයට අදාල මිළ මෙම ගිණුමට ගැළපීම මෙතෙක් සිදුකර නොමැති අතර, එය 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.	භෞතික පැවැත්මක් නොමැති තොග වටිනාකම් හඳුනාගෙන අදාල ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.
(ඉ)	මණ්ඩලය විසින් මුල්හල්කැලේ වතුයායේ රු.1,067,176ක පැරණි ගෙවිය යුතු පාරිතෝෂික ශේෂය මුළු ගෙවිය යුතු පාරිතෝෂික ශේෂයෙන් අඩු කර තිබීම නිසා මණ්ඩලයේ ගෙවිය යුතු පාරිතෝෂික ශේෂය එම වටිනාකමින් අවගණනයවී තිබුණි.	මුල්හල්කැලේ වතුයාය සම්බන්ධව පවතින ශේෂ පත්‍රයේ ගෙවියයුතු පාරිතෝෂික ශේෂය ලෙස හර අගයක් ලෙස පෙන්නුම් කරන අතර මෙම ශේෂ සම්බන්ධව තොරතුරු ආයතනය සතුව නොමැත. එම නිසා එම ශේෂය 2022 වර්ෂයේදි ශේෂ පත්‍රය තුළ එම ශේෂය වෙනම පෙන්විමට කටයුතු කර ඇත.	මෙම ශේෂ සම්බන්ධව තොරතුරු රැස්කරගෙන අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතුය.
(ඊ)	1996 වර්ෂයට පෙර සිට අවිනිශ්චිත ගිණුම් යටතේ දක්වා ඇති රු.4,342,561 ක හර ශේෂයක් හා රු.1,863,756 ක බැර ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	රු.4,342,561ක මෙම වතු වලට අයත් ශේෂය හා රු.1,863,756 ක ප්‍රධාන කාර්යාලයේ අවිනිශ්ෂිත ගිණුමේ ශේෂය 1996 වර්ෂයට පෙර සිට පැවැත එන ශේෂයන් වන අතර, මේ සම්බන්ධයෙන් තොරතුරු සොයා ගැනිමට නොහැක.	අවිනිශ්චිත ගිණුම් ශේෂයන්ට අදාල සාක්ෂි හඳුනාගෙන ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(උ)	මහවැලි ව්‍යාපෘතියට යටවී භෞතික පැවැත්මක් නොමැති ශේෂය රු.6,013,927ක් වූ මහවැලි අධිකාරිය	ඔනුගල් ඔය වත්ත මහවැලි ව්‍යාපෘතිය සඳහා මහවැලි අධිකාරිය විසින් පවරා ගත් ඉඩමක් වන අතර, එය මහවැලි	භෞතික පැවැත්මක් නොමැති වත්කම් හඳුනාගෙන නිවැරදි

විසින් පවරා ගෙන තිබූ ඕනුගල්ඔය වතුයායේ ශේෂය මූල්‍ය ප්‍රකාශන තුළින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.	ව්‍යාපෘතිය නිසා යටවීම හේතුවෙන් ඊට අදාළ ස්ථාවර වත්කම්වලද භෞතික පැවැත්මක් නොමැත. ඉඩම් අංශයෙන් ලබාදුන් ලිපියක පිටපතට අනුව ඕනුගල් ඔය වත්ත මහවැලි ව්‍යාපෘතියට ලබාගත් බවට තොරතුරු දැක්වෙන තව දුරටත් කරුණු සොයා ගැනීමෙන් අනතුරුව වත්කම් වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.	ක්‍රමවේදයන් මඟින් ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.

1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

	විෂයය	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.	අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.	වෙනස රු.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙතින් මණ්ඩලයට ලැබිය යුතු ණය හා පොලී ශේෂය	119,318,496	97,709,342	21,609,154	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙතින් වතු සංවර්ධන මණ්ඩලය වෙත ලැබිය යුතු ණය ශේෂය රු.119,318,496 ක් විශ්ලේෂණය කර සාරාංශ කර වාර්තාවක් අප විසින් රාජ්‍ය වැවිලි සංස්ථාව වෙතද, රජයේ විගණනය වෙත හා අමාත්‍යාංශ විගණනය වෙත ලබාදී ඇති අතර, අප විසින් යවන ලද වාර්තාවට පිළිතුරු වශයෙන් ඔවුන්ගේ ගිණුම් වලට අනුව වතු සංවර්ධන මණ්ඩලයට අයත් ලෙජර් ගිණුම් වල පිටපත් පමණක් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව අපවෙත ඒවා ඇති අතර, ප්‍රමාණවත් තොරතුරු නොමැති බැවින් එම ගිණුම් හා සත්තේක්ෂණය කිරීම අපහසු වී ඇත.	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙතින් මණ්ඩලයට ලැබිය යුතු ණය හා පොලී ශේෂය නැවත අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	සමුච්චිත ක්ෂය ආරම්භක ශේෂය	901,981,969	898,991,053	2,990,916	2021.01.01 ජන තේ හා පලෙයි වතුයායන්හි ක්ෂය විගණන විමසුමෙහි අගයට එකතු	මූල්‍ය ප්‍රකාශන වල වටිනාකම, අනුරූපී වාර්තා සමඟ එකඟ

					වී නොමැති වි ඇති බැවින් මෙම වෙනස සිදුවී ඇත.	විය යුතුයි.
(ඇ)	සමුච්චිත ක්ෂයවීම්වල අවසාන ශේෂය	931,613,515	928,510,156	3,103,359	2021.01.01 ජන තේ හා පලෙයි වතුයායන්හි ක්ෂය විගණන විමසුමෙහි අගයට එකතු වී නොමැති වි ඇති බැවින් මෙම වෙනස සිදුවී ඇත.	මූල්‍ය ප්‍රකාශන වල වටිනාකම්, අනුරූපී වාර්තා සමඟ එකඟ විය යුතුයි.
(ඇ)	ගස් විකුණුම් ආදායම	129,765,958	131,963,104	2,197,146	විගණන විමසුමෙහි සදහන් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව ගස් විකිණීමේ ආදායම මූල්‍ය ප්‍රකාශන අනුව රු.129,765,958කි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල හා වන සම්පත් අංශයේ ශේෂය අතර වෙනස රු. 2,197,145.96ක මුදල ගස් සදහා දරන ලද වියදම් වන අතර ගිණුම් අංශය විසින් එම වියදම් අඩුකර මූල්‍ය ප්‍රකාශනවල ගස් විකිණීමේ ආදායම පෙන්නුම් කර ඇත.	මූල්‍ය ප්‍රකාශන වල වටිනාකම්, අනුරූපී වාර්තා සමඟ එකඟ විය යුතුයි.

1.5.5 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අඛණ්ඩව අලාභ ලැබීම මත 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ශුද්ධ වත්කම් හා කාරක ප්‍රාග්ධනය පිළිවෙලින් රු.1,285,528,242ක හා රු.2,148,404,725ක සෘන අගයන් ගෙන තිබුණු අතර එදිනට පැහැර හරින ලද ව්‍යවස්ථාපිත ගෙවීම් රු.2,067,043,833ක් වී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පාරිතෝෂික වෙන්කිරීම් ශේෂය රු.927,760,728 ක් වු අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.636,200,235ක ගෙවිය යුතු පාරිතෝෂික ශේෂයක් ද පැවතුණි. මෙම බැදීම් පියවීමට ප්‍රමාණවත් ආයෝජනයන්ද සිදුකර නොතිබුණු අතර පියවිය යුතු බැංකු ණය ශේෂය රු.269,540,047ක් වී තිබුණි.මේ අනුව මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ	මණ්ඩලය සතුව පවතින ඉඩම් ගොඩනැගිලි හා අනෙකුත් වත්කම් නිසි පරිදි ප්‍රත්‍යාගණනයක් සිදුකර එම අගයන් පොත් වලට නොගැනිම හේතුවෙන් සෘණ අගයක් ගෙන ඇති අතර නැවත වත්කම් තක්සේරුවක් සිදුකල හොත් එම අගය ධනාත්මක අගයන් වනු ඇත. නමුත් එම කටයුතු සිදුකර ගැනිමට නොහැකි වී ඇත්තේ ආයතනයේ දිගින් දිගටම පවත්නා කාරක ප්‍රාග්ධන ඌනතාවයයි. එම හේතුව නිසාවෙන්ම නිසා මෙහි සදහන් ව්‍යවස්ථාපිත දීමනා ගෙවීමට පවා නොහැකි වී ඇති බවත් සදහන් කර ඇත. එසේම වරින් වර වර්ෂයෙන් වර්ෂයට මහා භාණ්ඩාගාරයෙන් ලැබු මුදලින් මෙම හිඟ ව්‍යවස්ථාපිත දීමනා ගෙවීම්	මණ්ඩලය සතුව පවතින ඉඩම් ගොඩනැගිලි හා අනෙකුත් වත්කම් නිසි පරිදි ප්‍රත්‍යාගණනයක් සිදුකර එම අගයන් පොත් වලට ගැනීමටත්, ආයතනයේ දිගින් දිගටම පවත්නා කාරක ප්‍රාග්ධන ඌනතාවයන් මඟහරවා ගැනීමට උපායමාර්ග සකස් කර ගැනීමටත්, අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව මණ්ඩලය ප්‍රතිසංවිධානයන් සිදුකළ යුතුය.

ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවත්නා බව නිරීක්ෂණය විය. එසේම 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් අංක 2.4 මගින් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව මණ්ඩලය ප්‍රතිසංවිධානය කළ යුතු බව හෙළිදරව් කර තිබුණද විගණිත දිනය වන 2025 මාර්තු 03 දින දක්වාම එබඳු ප්‍රතිසංවිධානයක් සිදු කර නොතිබුණි. සිදුකර ඇත. 2020 මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් අංක 2.4 මගින් දක්වා ඇති ප්‍රතිසංවිධාන කටයුතු සිදුවූ දේශපාලනික වෙනස්කම් මත සිදු වී නොමැති බැවින් මෙම සටහන 2022 මූල්‍ය ප්‍රකාශන තුලින් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.

1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විෂය	මුදල රු.	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රධාන කාර්යාලයේ ඉඩම්, ගොඩනැඟිලි සහ වතුයායන්ගේ ගොඩනැඟිලි, ඩාලි පාරේ පිහිටි ගබඩා කාර්යාල සහ පාරිභෝජ්‍ය අංශයට අදාල ගොඩනැගිල්ල, වෙනත් දේපල පිරියත හා උපකරණ සහ වතුයායන් තුළ ක්‍රියාත්මක කර තිබුණු ජල සම්පාදන ව්‍යාපෘතිය	1,568,000,308	විස්තරාත්මක උපලේඛන ඉඩම්වල පිඹුරුපත් , සැලසුම්, තක්සේරු වාර්තා, පැවරීමට අදාල ගැසට් පත්‍ර, වාර්ෂික භෞතික සත්‍යාපන වාර්තා, වර්ග අඩි ප්‍රමාණය, ඉංජිනේරු සැලසුම්, සහ තක්සේරු වාර්තා, ස්ථාවර වත්කම් ලේඛනය ශක්‍යතා අධ්‍යයන වාර්තාව, අනුමැතීන්, ක්‍රියාත්මක කළ වර්ෂයන් සහ වියදම් සහතික කිරීම් සඳහා වවුචර්, කළ වැඩ වාර්තා	ප්‍රධාන කාර්යාලයේ ඉඩම් හා ගොඩනැගිලි ලෙස සඳහන් කර ඇති ප්‍රධාන කාර්යාලයට අයත් ඉඩම් හා ගොඩනැගිලි රු.1,503,744,550 හි ඇතුලත් රු.1,489,375,963 පිළිබඳ විස්තරාත්මක තොරතුරු 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සමග ලබා දී ඇත. අනිකුත් දේපළ සහ ගොඩනැගිලි වලට අදාළ විස්තරාත්මක තොරතුරු සොයාගැනීමට නොහැකි වී ඇත.	ප්‍රධාන කාර්යාල ගොඩනැගිලි, ඉඩම් සහ ගොඩනැගිලි වල ශේෂ සනාථ කිරීමට ලේඛන සාක්ෂි පවත්වාගෙන ගොස් ශේෂයේ නිවැරදිතාව තහවුරු කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	කෙරීගෙන යන වැඩ	6,685,165	ගෙවීම් වවුචර්පත්,වැටුප් ගෙවීම් විස්තර, පිරිවැය වාර්තා සහ අනුමැතීන්,අනුමත ඇස්තමේන්තු	මෙම ව්‍යාපෘති දැනට නොපවතින බව ලුල්කඳුර වතුයායේ වතු අධිකාරි විසින් ලිඛිතව දැනුම් දී ඇති අතර ඊට අදාළ වියදම් සම්බන්ධ තොරතුරු ලබාදී නොමැත.	කෙරීගෙන යන වැඩ වටිනාකම ලේඛනගත සාක්ෂි මඟින් තහවුරු කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ජීව විද්‍යාත්මක වත්කම්- පරිනත වගාව	17,925,652	ගස් සංගණන වාර්තා සහ වටිනාකම තක්සේරු කිරීමට	මෙම රු.17,295,652ක වටිනාකමකින් යුතු පරිණත වගාව 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුලින් ජීව විද්‍යාත්මක	වත්කම්වලට අදාල වාර්ථා මඟින් ශේෂ තහවුරු කළ

			අදාල වාර්තා	වත්කම් වෙත මාරු කර නිවැරදි කර ඉදිරිපත් කර ඇත. නමුත් මෙම ශේෂයන් 1996 පෙර සිටම ලෙජර් ගිණුම් තුළින් ඉදිරි ශේෂයන් වන අතර, ඒ සම්බන්ධව තොරුතුරු වාර්තා සොයා ගැනිමට ආයතනය තුළ නොමැත.	යුතු අතර ශේෂ තහවුරු කළ නොහැකිනම් ගිණුම්වලින් නිවැරදි ක්‍රමවේදයකට ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	ප්‍රධාන කාර්යාලය සහ වතුයායන්ට අදාල වෙළෙඳ හා අනිකුත් ලැබිය යුතු දෑ - ගැලපුම් ශේෂය, පාරිභෝගික අංශයේ පැරණි ණය ගැති ශේෂය සහ ලැබිය යුතු රඳවාගත් බදු, වැව්ලි සංවර්ධන ව්‍යාපෘතිය, එකතු කළ අගය මත බදු ශේෂයන් සහ බදු දී තිබුණු මොන්ත ක්‍රිස්ටෝ වතුයායේ වත්කම් හා වගකීම් ගිණුම්වලට අදාල පාලන ගිණුම් ශේෂයන්	98,827,279	ශේෂ සනාථන, ශේෂ පත්‍ර දිනෙන් පසු පියවීම් සහ කාල විශ්ලේෂණ සහ අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග	මෙම ශේෂයන් සම්බන්ධ විස්තරාත්මක උපලේඛන ගිණුම් අංශය සතුව නොමැති අතර ඉදිරියේදි මේ සම්බන්ධව තොරතුරු ලද පසු ඉදිරි කටයුතු කරනු ඇත.	ලැබිය යුතු ශේෂය තහවුරු කිරීමට ශේෂ සනාථ කිරිම් සහ ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(ඉ)	මහවැලි නිවාස ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු ශේෂය සහ සංචිත ශේෂය තුළ ඇතුළත් වැවිලි සංවර්ධන ව්‍යාපෘති සංචිත වටිනාකම සහ වෙනස් නොවන පැරණි පොදු සංචිත වටිනාකම	332,106,721	ශේෂ සනාථ කිරීමේ ලේඛන,කළ වැඩ වාර්තා සහ සහතික කළ බිල්පත් සහ කාල විශ්ලේෂණ	මහවැලි ව්‍යාපෘතියෙන් යටවූ ගෙවල් හා ඉඩම් නැවත ප්‍රතිසංස්කරණය කිරිම සඳහා මෙම මුදල් මහවැලි සංවර්ධන මණ්ඩලය විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත ලබා දී ඇති අතර ආයතනය විසින් එම මුදල් එම කාර්යය සඳහා යොදවා ගෙන නොමැත. නමුත් මේ සම්බන්ධව තොරතුරු ගිණුම් අංශය සතුව නොමැති අතර ඉඩම් අංශයෙන් විමසිම් කර ඇත. මේ සම්බන්ධයෙන් තොරතුරු ලද පසු ඊට අදාළ ගැලපුම් සිදුකිරිමට කටයුතු කරනු ඇත.	අදාල මූලාශ්‍ර ලේඛන හඳුනාගෙන ශේෂ තහවුරු කිරීමට කටයුතු කළ යුතුයි.
(ඊ)	කල්බදු වත්කමට එරෙහිව තැන්පතු (Deposit against Asset Lease) ශේෂය, ඉඩම් සහ ගොඩනැගිලි බදු දීමට අදාල අත්තිකාරම්,ප්‍රධාන කාර්යාලයේ ආපසු ගෙවිය යුතු තැන්පතු, ආරක්ෂිත තැන්පතු වගකීම්,පාරිභෝගික අංශයේ වෙළඳ ණයහිමි ශේෂය සහ ප්‍රධාන කාර්යාලයේ කල්බදු ණයහිමි ශේෂය	252,522,867	ශේෂ සනාථ කිරීමේ ලේඛන,තැන්පතුවලට අදාල ලදු පත්,කාල විශ්ලේෂණ	මෙම ශේෂ 2015 ට පෙර සිට පැවත එන ශේෂ බැවින් දැනට අවශ්‍ය තොරතුරු සොයා ගැනිමට අපහසු බැවින් ඉදිරියේදි ලැබෙන තොරතුරු මත සත්තේක්ෂණය කිරිමට කටයුතු කරනු ඇත.	තැන්පතු වටිනාකම තහවුරු කිරීමට අදාල ලේඛන සාක්ෂි හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(උ)	ගෙවිය යුතු බදු වගකීම්වලට (VAT,NBT,ESC) සහ ගෙවිය යුතු පැරණි සේවක වැටුප් හා වේතන	226,654,020	දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලද සහන කාලසීමාවන්, කාලීන ගෙවීම්වලට අදාල වවුචර්පත්, නොගෙවීමට අදාල පැහැදිලි කිරීම් හා ලිඛිත ලේඛන සහ කාල විශ්ලේෂණ සහ විස්තරාත්මක ලේඛන	2024 සිට අදාල බදු නිසි පරිදි ආයතනය විසින් ගෙවීම සිදුකර ඇත.2020.07.22 සිට 2023.12.31 යන කාලපරිච්ඡේදයට අදාළව එකතු කල අගය මත බදු ගෙවීමේ ආයතනයට අනුව අක්‍රිය කාල පරිච්ඡේදයක් වේ. මෙම ශේෂ ඊට පෙර සිට පැවැතෙන ශේෂ වන අතර, එවකට පැවැති මූල්‍ය දුෂ්කරතා නිසා ගෙවීම සිදුකිරිමට	නිවැරදි සාක්ෂි පදනම්ව ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

				නොහැකි වී ඇත. නමුත් එම ගෙවීමට ඇති හිග මුදල් වාරික වශයෙන් ගෙවීමට අප විසින් ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් ලිඛිතව ඉල්ලීම් කර ඇත. ඒ අනුව ඉදිරියේදි වාරික වශයෙන් ගෙවීමට කටයුතු කරනු ඇත.	
(ඉ)	පොලී සහිත ණය ගැනීම් සහ මහජන බැංකුව වෙතින් ලබා ගත් ණය මුදල	161,060,658	ශේෂ සනාථ කිරීමේ ලේඛන, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය,ණය ගිවිසුම්,පොළිය සහ ණය ගෙවීම් විස්තර සහ ශේෂ සනාථන	මෙම මහජන බැංකුව වෙතින් ලබාගෙන ඇති ණය මුදල ඉතා පැරණි ශේෂයක් වන අතර මේ සම්බන්ධ තොරතුරු ආයතනය සතුව නොමැත. නමුත් අප විසින් මේ සම්බන්ධව තොරතුරු ලබා ගැනීම සඳහා මහජන බැංකුව වෙත දැනුම් දුන්නද ඔවුන් විසින් කිසිදු තොරතුරක් අපවෙත ලබාදී නොමැත.	ණය ශේෂ සනාථ කිරීමට මහජන බැංකුව වෙතින් ලබාගත් ශේෂ සනාථන මගින් තහවුරුකර නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඉඩම් සහ ගොඩනැගිලි බදු දීම සහ තේ දළු විකිණීමට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.318,410,551ක ශේෂය තුළ වසර 3ට වැඩි රු.121,148,546ක ශේෂයන් පවතින අතර රු.මි.2කට වඩා වැඩි වසර 6 ඉක්ම වූ රු.39,432,101ක් වූ ශේෂයක්ද අයකර ගෙන නොතිබුණි.	මෙම ලැබිය යුතු ශේෂ ගිණුම් වල ඇති ශේෂයන් නිවැරදි නොවිය හැකි වන අතර, විගණන විමසුමෙහි සඳහන් කර ඇති වසර 6 ඉක්මවූ රු. මිලියන 2ට වැඩි රු.39,432,103/- තුළ ඇතුලත් බොහෝමයක් ආයතනවලට ශේෂ සනාථන ලිපි යවා ඇතත්, ඒ සම්බන්ධව තොරතුරු අප වෙත ලැබී නොමැත. තවද මෙම ලැබිය යුතු ගිණුම් සත්තේක්ෂණය කර නිවැරදි කර අයකර ගැනිමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස ඉඩම් අංශයෙන් දැනුවත් කිරිමට කටයුතු කරනු ඇත.	වසර ගණනාවක සිට පවතින අය විය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ආ)	මණ්ඩලයේ වතුයායන්ට අදාල රු.42,528,311ක වෙළඳ ණයගැති ශේෂය තුළ වතුයායන් 05කට අදාලව 2004 වර්ෂයේ සිට තේ දළු විකුණුම් වලට අදාල රු. 2,641,925ක ණයගැති ශේෂයක් සහ වසර 5කට වැඩි රු.35,259,358ක් වූ ණයගැති ශේෂයන් ද පාරිභෝගික අංශයේ වසර 03 ඉක්මවූ රු.12,639,676ක ණය ශේෂයක් පැවතියද එම ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි.	වසර 5කට වඩා පැරණි රු.2,641,925ක ශේෂය සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කර ඇති අතර එම තොරතුරු අනුව මෙම ශේෂය අයකර ගැනීමේ හැකියාව පිළිබඳව තව දුරටත් සොයා බැලිය යුතුය. පාරිභෝගික අංශයේ රු. 12,679,636/- ක වර්ෂ 03 ට වැඩි ශේෂය තුළින් රු. 39,960/- ක මුදලක් පමණක් දැනට මුදල් ලැබී ඇත.	කාලයක සිට පැවත එන ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

1.6.2 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
වතුයායන්ගේ ණයහිමි කාල විශ්ලේෂණයට අනුව රු.129,845,276ක් වූ ණයහිමි ශේෂයෙහි, වතුයායන් 18ක වසර 05 ඉක්ම වූ රු.94,601,161ක ණයහිමි ශේෂයක් ද, වතුයායන් 10ක වසර 4-5ත් අතර රු.4,183,637ක් වූ ණයහිමි ශේෂයක් විය. තවද ප්‍රධාන කාර්යාලයට අයත් රු.143,290,771ක වෙළඳ ණයහිමි වටිනාකම තුළ වසර 6කට වැඩි රු.83,500,633ක සහ වසර 3-6 අතර රු.13,658,407ක ණයහිමි ශේෂයක් ද විය.	ආයතනයේ පවතින දැඩි කාරක ප්‍රාග්ධන මූල්‍ය හිඟය නිසා මෙම ණය හිමියන් වෙත මුදල් ගෙවීම ප්‍රමාද වී ඇති නමුත් ඉදිරියේදී මුදල් පවතින ආකාරයට මෙම ණය හිමියන් වෙත ගෙවීමට කටයුතු කරනු ඇත.	මෙම ණයහිමි ශේෂ නිවැරදිව හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ ii වන කොටසේ 5 (1) උප වගන්තිය	සේවකයකු විශ්‍රාම ගිය හෝ මරණයට පත් දින සිට දින 30 ක් ඇතුළත පාරිතෝෂික ගෙවීම් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානයට රු.636,200,235ක ගෙවිය යුතු පාරිතෝෂික ශේෂයක් සහ රු.182,245,195 ක ගෙවිය යුතු අධිභාර ශේෂයක් ද පැවතුණි.	දිගින් දිගටම ආයතනයේ පවතින කාරක ප්‍රාග්ධන මූල්‍ය දුෂ්කරතා නිසා ආයතනයේ සේවක පාරිතෝෂික මුදල් නිසි පරිදි ගෙවීම සිදු කිරීමට නොහැකි වී තිබූ අතර, වර්තමානය වන විට නඩු දැමූ සේවකයන්ට 2023 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/0768/616/017 අනුව ලැබෙන රු. මිලියන 30ක මුදලින් හා වර්තමානයේ පවතින මුදල් ප්‍රවාහයෙන්	පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව පාරිතෝෂික නියමිත කාලයේදී ගෙවීමට කටයුතු කිරීම තුළින් අනාර්ථික වියදම් වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය.

			සේවයෙන් ඉවත්ව ගිය හා යන අනුපිළිවෙලට පාරිතෝෂික මුදල් ගෙවීම් සිදුකරමින් පවතිනු ඇත.	
(ආ)	1998 අංක 15 දරන සංශෝධිත සේවක අර්ථසාධක අරමුදල් පනතේ 15 වගන්තිය	ගෙවිය යුතු අර්ථසාධක ලෙස රු.995,794,224ක් ද වතු කාර්ය මණ්ඩල අර්ථසාධක සංගමයට (ESPS) සහ ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සංගමයට (CPPS) රු.129,774,730 ක හිඟ ශේෂයක්ද පැවතුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට මූල්‍ය ප්‍රකාශන අනුව ඉහත අරමුදල් සඳහා රු.39,824,048ක ගෙවිය යුතු අධිභාර ද ගෙවා නොතිබුණි.	ආයතනයේ පැවති දැඩි කාරක ප්‍රාග්ධන මූල්‍ය හිඟය නිසා 2000 වර්ෂයේ පමණ සිට EPF/ETFදිගින් දිගටම ගෙවීමට නොහැකි වී තිබූ අතර, මුදල් අමාත්‍යාංශයෙන් සමහර වර්ෂවල මෙම හිඟ ව්‍යවස්ථාපිත මුදල් ගෙවීම සඳහා අරමුදල් ලබාදීඇත. ඒ අනුව එම මුදලින් ගෙවීම් සිදු කර ඇත. ඊට අමතරව 2023 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/0768/616/017 අනුව රු. මිලියන 30ක මුදලක් සෑම මසකම, මෙම හිඟ ව්‍යවස්ථාපිත දීමනා නැවත ගෙවීම්සඳහා ලබා දෙමින් පවතී. එමගින් හිග ව්‍යවස්ථාපිත දීමනා නැවත ගෙවීම් සිදුකරගෙන යමින් පවතිනු ඇත.	පනත ප්‍රකාරව අර්ථසාධක අරමුදල් වාරික නිසි පරිදි ගෙවීම තුළින් අනාර්ථික වියදම් වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනතේ 16 (1) වන උප වගන්තිය	2011 වර්ෂයේ සිට සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට ගෙවිය යුතු රු.82,369,546ක දායක මුදල් ගෙවා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට මූල්‍ය ප්‍රකාශන අනුව භාරකාර අරමුදලට රු.835,855ක ගෙවිය යුතු අධිභාර ශේෂයක්ද විය.	ආයතනයේ පැවති දැඩි කාරක ප්‍රාග්ධන මූල්‍ය හිඟය නිසා 2000 වර්ෂයේ පමණ සිට EPF/ETFදිගින් දිගටම ගෙවීමට නොහැකි වී තිබූ අතර, මුදල් අමාත්‍යාංශයෙන් සමහර වර්ෂවල මෙම හිඟ ව්‍යවස්ථාපිත මුදල් ගෙවීම සඳහා අරමුදල් ලබාදීඇත. ඒ අනුව එම මුදලින් ගෙවීම් සිදු කර ඇත. ඊට අමතරව 2023 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/0768/616/017 අනුව රු. මිලියන 30ක මුදලක් සෑම මසකම, මෙම හිඟ ව්‍යවස්ථාපිත දීමනා නැවත ගෙවීම්සඳහා ලබා	පනත ප්‍රකාරව අරමුදලට ගෙවිය යුතු වාරික නියමිත පරිදි ගෙවීම තුළින් අනාර්ථික වියදම් වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය.

			දෙමින් පවතී. එමගින් හිග ව්‍යවස්ථාපිත දීමනා නැවත ගෙවීම් සිදුකරගෙන යමින් පවතිනු ඇත.	
(ඇ)	2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනතේ 93 වන වගන්තිය	2021/2022 තක්සේරු වර්ෂයට අදාල ආදායම් බදු වාර්තාව 2024 පෙබරවාරි 11 දින ඉදිරිපත් කර තිබුණි.	ආයතනයේ මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කිරිම ප්‍රමාද වීම හේතුවෙන් ආදායම් වාර්තා ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත යැවීම ප්‍රමාද වී ඇත. ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත විගණිත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම අවශ්‍ය විම මීට හේතු වී ඇත. නමුත් 2024 වර්ෂයේදි ආදායම් බදු දෙපාර්තමේන්තුව සමග සිදුකරන ලද සාකච්ඡාවට අනුව 2021 වර්ෂයේ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන සමග ආදායම් බදු වාර්තාව 2024.02.11 දින ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.	පනතේ වගන්ති ප්‍රකාරව තක්සේරු වර්ෂයට අදාල ආදායම් ඇතුලත් බදු වාර්තාව නියමිත පරිදි දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට භාර දීමට කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 459,399,025ක අලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අලාභය රු. 348,392,616 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.111,006,409 කින් සමස්ථ අලාභයේ වැඩිවීමක් නිරීක්ෂණය විය. මෙම අලාභයේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් මණ්ඩලයේ තේ, රබර් සහ අනෙකුත් භෝග වගාවන්ට අදාල විකුණුම් පිරිවැය සමස්ථයක් ලෙස රු.477,926,194කින් වැඩිවීම හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ තේ දළු විකිණීමෙන් ලද ආදායම 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේදී සියයට 20කින් වැඩි වී ඇති අතර, රබර් වගාවෙන් ලද ආදායම් 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේදී සියයට 61ක් වැඩි වී තිබුණි. 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේ තේ දළු හා පාරිභෝජ්‍ය අංශයේ තේ නිෂ්පාදනයට අදාල පිරිවැය පිළිවෙලින් සියයට 41කින් හා සියයට 10කින් වැඩිවී තිබුණි.එමෙන්ම රබර් වගාවට අදාල පිරිවැය 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේදී සියයට 18කින් වැඩි වී තිබුණි.

2.3 අනුපාත විශ්ලේෂණය

- සමාලෝචිත වර්ෂයේ දී හා පෙර වර්ෂයේ දී ජංගම අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය 0.3:1 ක් හා 0.3:1ක් විය.

- සමාලෝචිත වර්ෂයේ දළ අලාභ අනුපාතය සියයට 44ක් වූ අතර, පසුගිය වර්ෂයේ දී එම අනුපාතය සියයට 34ක් විය.

- සමාලෝචිත වර්ෂයේ දී ශුද්ධ අලාභ අනුපාතය සියයට 38ක් වූ අතර, පසුගිය වර්ෂයේ දී එම අනුපාතය සියයට 34ක් විය.

මණ්ඩලයේ 2020 හා 2021 වර්ෂයන්හි ඉහත සඳහන් අනුපාත පරීක්ෂාවේදී පවතින ජංගම වත්කම් වලින් එහි ජංගම වගකීම් පියවා ගැනීමේ හැකියාවක් නොමැති බවත් දළ හා ශුද්ධ අලාභ තත්ත්වය දිගින් දිගටම පැවතීමත් හා ආයතනයේ ස්කන්ධ ප්‍රාග්ධනය ඉක්මවූ ණය ප්‍රාග්ධනයක් පැවතීමත් තුළින් ආයතනයේ පවතින මූල්‍ය දුෂ්කරතාවය හා අඛණ්ඩ පැවැත්මේ අවධානම පිළිබඳ විගණනයේදී තවදුරටත් නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අනාර්ථික ගනුදෙනු

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මණ්ඩලය විසින් ක්‍රියාත්මක කර තිබුණු කෙරී ගෙන යන වැඩවල ඇතුළත් කොම්පෝස්ට් ඇතුළු සුළු අපනයන භෝග ව්‍යාපෘතීන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රු.27,814,517ක පිරිවැයක් දරා තිබුණද වර්තමානය වන විට ව්‍යාපෘතීන් ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණු අතර ඒ වෙනුවෙන් දරන ලද වියදම් අනාර්ථික වියදම් බවට පත්වී තිබුණි.	මෙම කෙරීගෙන යන වැඩ සම්බන්ධ විස්තර වතුයායන් වල පවතින අතර එම තොරතුරු ප්‍රධාන කාර්යාලය විසින් වතු වෙතින් ඉල්ලුම් කලද තවමත් ඔවුන් විසින් පිළිතුරු ලබා දී නොමැත. එම නිසා මෙම වියදම් සම්බන්ධ තොරතුරු අදාල වතුයායන්ගෙන් ලබාගෙන විශ්ලේෂණය කිරීමට කටයුතු කරනු ඇත.	පිරිවැය හා ප්‍රතිලාභ පිළිබඳ ශක්‍යතා වාර්තාවක් සහ මනා සැලැස්මක් මත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු අතර අනාර්ථික වියදම් සම්බන්ධයෙන් අභ්‍යන්තර පරීක්ෂාවක් සිදු කිරීමට කටයුතු කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කෘෂිකාර්මික තිරසාර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා 2007 නොවැම්බර් මස සිට මණ්ඩලය සහ පෞද්ගලික සමාගමක් සමග නාගස්තැන්න වතු යාය බදු දීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණද, ගිවිසුම් ගත වී වසරක් ගතවීමට පෙර වතු යායේ ගස් 120ක් අනවසරෙන් කපා ඉවත් කිරීම හේතුවෙන් එය නැවත මණ්ඩලයට පවරාගෙන තිබුණු අතර එම ගස්වල	කෘෂිකාර්මික තිරසාර සංවර්ධන ඉටුකර ගැනිම සඳහා 2007 නොවැම්බර් මස නාගස්තැන්න වතුයාය පාලනය කිරිම වෙනුවෙන් බද්ධ ව්‍යාපාර ගිවිසුමක් ක්වින්රිච් ඇග්‍රෝ සමාගම සමඟ අත්සන් කොට ඇත. ඒ අනුව ක්වින්රිච් ඇග්‍රෝ පුද්ගලික සමාගම විසින් එම සමාගමේ ආයෝජනය වෙනුවෙන් රු.මි.30 ක් ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත ගෙවන ලදි.	විධිමත් පරීක්ෂණයක් පවත්වා මණ්ඩලයට සිදුවී තිබුණ අලාභය නිවැරදිව තක්සේරු කර අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

	අලාභ අයකර ගැනීමට 2008 මැයි මාසයේ පොළිස් අපරාධ දෙපාර්තමේන්තුවේ නඩුවක් පවරා තිබුණි. මණ්ඩලයේ වැවිලි කළමණාකරු විසින් 2008 වර්ෂයේදී ලබා දුන් ප්‍රකාශයට අනුව රු.11,200,000ක අලාභයක් මණ්ඩලයට සිදුවී ඇති බව දන්වා තිබුණද එම අලාභය තක්සේරු කර අයකර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණු අතර නඩු කටයුත්තද දෙපාර්ශවයේ එකඟතාවයෙන් අවසන් කර තිබුණි.	ඒ අනුව වතුයායේ පාලනය ක්වීන්රිච් ඇග්‍රෝ පුද්ගලික සමාගමට භාරදුන් අතර 2008 වර්ෂයේදී ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ අවසරයකින් තොරව එම සමාගම විසින් වටිනා ගස් කපා ඉවත් කොට තිබුණි. එබැවින් අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවේ වාණිජ අපරාධ විමර්ෂණ අංශයට පැමිණිලි කර ඇත.ඒ අනුව ශ්‍රී ලංකා පොලිසිය විසින් බී 2683 යටතේ රුවන්වැල්ල දිසා අධිකරණයේ නඩු පවරා ඇත.පොලිසි පැමිණිල්ල තුල රු.මි.11.2 ක් ලෙස මෙම ගස්වල වටිනාකම සඳහන් කර තිබුනද 2009.12.18 වන දින ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ක්වීන්රිච් ඇග්‍රෝ පුද්ගලික සමාගම අතර අත්සන් කරන ලද මෙම නඩුවට අදාල ලිපිය තුල එම ගස්වල වටිනාකම රු.7,529,688.40 ක් බවට සඳහන් කර ඇත. වත්ත තුල ඉතිරි දැව කොටස් වල වටිනාකම රු.1,397,078.25 ක් ලෙස සඳහන් කොට ඇත. එම ලිපිය තුල ඔවුන් විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ තැන්පත් කරන ලද රු.මි.30 ක් වූ ගෙවීම සහ ඔවුන් විසින් වතුයාය පාලනය කිරීමේදී යෙදවූ ප්‍රාග්ධන වියදම් තුලින් මෙම ගස්වල වටිනාකම හිලව් කර ඇති බව එම ලිපිය මගින් සනාථ වේ.	
(ආ)	නාගස්තැන්න සහ කන්දල්ඔය වතුයායන් වල පිළිවෙලින් රු.1,531,160 හා රු.1,256,046 ක මුදල් සොරා ගැනීම් සිදු වී වසර 10ක් පමණ ගතවී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන වන විටත් වගකිවයුතු නිලධාරීන්ගෙන් අලාභයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	කන්දල්ඔය නාගස්තැන්න වතු දෙකෙහි සිදු වූ මුදල් වංචාව සම්බන්ධව නඩුව නුවර උසාවියේ HC/223/20 නඩු අංකය යටතේ මේ දක්වා විභාග වෙමින් පවතී.2025/03/06 දින පැවති මෙම නඩුව ඉදිරියේදී 2025/06/20 දින පැවැත්වීමට නියමිත අතර ඉදිරියේදී ලැබෙන නඩු තීන්දුව අනුව කටයුතු කරනු ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව වගකිවයුතු නිලධාරීන්ගෙන් අලාභයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	වොක්ෂෝල් වීදියේ පිහිටි මණ්ඩලය සතු ගබඩා 2ක් තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව 2005 වර්ෂයේදී වසර 30කට රු.105,000ක මාසික බදු කුලියකට පෞද්ගලික සමාගමක් වෙත	නො.175, වොක්ෂෝල් විදිය කොළඹ 02 පිහිටි ගබඩා දෙකක් තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව 2005 වසරේ පැවති පාලනාධිකාරිය විසින් නිලෝනා ලංකා පුද්ගලික	බදු ගිවිසුම් ප්‍රකාරව තක්සේරු වාර්තා පදනම්ව හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. බදු ගිවිසුම් සකස් කිරීමේදී බදු මුදල්

බදු දී එම බදු ගිවිසුම අවසන් වීමට පෙර නැවත එම බදුකරු සමඟ 2011 වර්ෂයේදී රු.105,000ක මාසික බදු කුළී වටිනාකමකට වසර 30කට බදු ගිවිසුමකට එළඹී තිබුණි. පළමු බදු ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව, මාසික තක්සේරු වටිනාකමේ වැඩිවීම රු.95,000 බැගින් මාසික වාරික 49 ක් වෙනුවෙන් රු.4,655,000 ක් හා රු.175,000 බැගින් මාසික වාරික 14 ක් වෙනුවෙන් රු.2,450,000 වශයෙන් රු.7,105,000 ක් 2005 දෙසැම්බර් සිට 2011 පෙබරවාරි දක්වා තක්සේරු වාර්තා පදනම් කරගෙන බදු අය කර ගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. තවද 2011 මාර්තු මාසයේදී ඇතිකරගෙන තිබූ දෙවන බදු ගිවිසුමෙහි තක්සේරු වාර්තා පදනම්ව බදු අය කළ යුතු බවට ගිවිසුමේ වගන්ති ඉවත් කර ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කිරීම නිසා 2020 වර්ෂයේදී ලබා ගත් තක්සේරු වාර්තාවට අනුව මාසික තක්සේරු වටිනාකම රු.224,000ක් වූයෙන් වටිනාකම වැඩිවීම රු.119,000 බැගින් මාසික වාරික 58 ක් වෙනුවෙන් රු.6,902,000 ක් සහ රු.353,000 බැගින් මාසික වාරික 36 ක් වෙනුවෙන් රු.12,708,000 වශයෙන් හා රු.438,000 බැගින් මාසික වාරික 36 ක් වෙනුවෙන් රු.15,768,000 ක් වශයෙන් රු.35,378,000 ක් 2011 මාර්තු සිට 2021 දෙසැම්බර් දක්වා තක්සේරු වාර්තාවට අනුව අයවිය යුතු බදු ආදායමක් මණ්ඩලයට අහිමිවී තිබුණි.	සමාගම වෙත බදු පදනම මත ලබාදී තිබුණි. ඉන් අනතුරුව එම බදු ගිවිසුම් දෙකට අදාල ගබඩාවන් වෙනස්කර 2011 වසරේදී නැවත එක් බදු ගිවිසුමක් අත්සන් කර තිබුණි. 2011 වසරේදි අත්සන් කරන ලද බදු ගිවිසුම තුල රජයේ තක්සේරුව මත බදු මුදල සංශෝධනය කිරීමට අදාල කොන්දේසි ඇතුලත් කර නොමැති බැවින් බදු මුදල් සංශෝධනය කිරීමට හැකියාවක් නොතිබිණි. මෙවැනි බදු ගිවිසුම් සම්බන්ධයෙන් නිතිපතිතුමාගෙන් ද කරුණු විමසා ඇතිමුත් දෙපාර්ශවයේ එකඟතාවයකින් තොරව කොන්දේසි ඇතුලත් කිරීම හෝ සංශෝධනය කිරීමක් කල නොහැකි බව දන්වා ඇත.එසේ හෙයින් බදු මුදල් වැඩි කිරීමේ හැකියාවක් නොමැත. අභියාචනාධිකරණ නඩු අංක 21271/එල්,21371/එල් අංක යටතේ 2014.12.15 දින ලබාදී ඇති තින්දුව ප්‍රකාරව එම බදු ගිවිසුම සඳහා නව බදු ගිවිසුමක් අත්සන් කිරීමේ හැකියාවක් නොමැත. එසේම නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම ඉඩම් අත්පත් කර ගැනිමට අදාල අමාත්‍ය මණ්ඩල අනුමැතියක්ද ලබාගෙන ඇත. ඉහත කරුණු මත මෙම ඉඩම් කොටස සඳහා බදු ගිවිසුම අවලංගු කිරීමක් හෝ සංශෝධනය කිරීමක් සිදුකල නොහැකි බැවින් මෙම තත්වය උදාවී ඇත.	වැඩිවීම නොසලකා හරින ලද නිලධාරීන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් තොරව ප්‍රධාන කාර්යාලයේ සහ චතුයායන් වල ගිණුම්මය ක්‍රියාකාරකම් 7ක් ඉටුකර ගැනීමට අදාල මෘදුකාංග පද්ධතියක් සඳහා පෞද්ගලික සමාගමකට 2021 වර්ෂයේ සිට 2025 අප්‍රේල් 30 දක්වා මෘදුකාංග පිහිටුවීමේ සහ මාසික ගෙවීම් වෙනුවෙන් රු.13,989,750 ක් ගිවිසුම් ප්‍රකාරව ගෙවා තිබුණද, මෘදුකාංග	මෙම ගිණුම්කරණ පද්ධතිය අඩුපාඩු පිළිබඳව විගණන හා කළමනාකරන කමිටුවට හා අධ්‍යක්ෂ මණ්ඩලයට කිහිප අවස්ථාවකදීම ලිඛිතව හා වාචිකව දැනුම් දී ඇති නමුත් ඒ සඳහා ගෙවීම් කිරීම අත්හිටුවීම සඳහා කිසිදු පාර්ශවයක් විසින් උපදෙස් ලබා දී නොමැත.	ගිණුම්කරණ පද්ධතිය තුළින් අපේක්ෂිත අරමුණු ඉටුනොවේනම් ඒ පිළිබඳව පරීක්ෂාවක් සිදු කර එහි අඩුපාඩු සකස් කර ගැනීමටත් ඉටු නොකරන ලද ක්‍රියාකාරකම්

	පද්ධතිය මගින් ඒකාබද්ධ මූල්‍යා ප්‍රකාශන පිළියෙල කිරීම,තොග පාලනය,ආදායම් හා වියදම් පාලනය යනාදි අරමුණු නිසි පරිදි ඉටු කර නොතිබුණි.		වෙනුවෙන් ගෙවූ මුදල් ආපසු අයකර ගැනීමට හෝ නව ගිණුම්කරණ පද්ධතියක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය යටතේ රත්නපුර රාස්සගල වත්තේ ඉඩම් අක්කර 1824 රූඩ් 01 පර්චස් 36න් අක්කර 50ට වැඩි ප්‍රකාශකයින් 20 දෙනෙකු වෙනුවෙන් අක්කර 1,270 රූඩ් 02 පර්චස් 30ක් 1996 දෙසැම්බර් 05 දිනැති ලිපිය පරිදි කොමිෂන් සභාව පවරා ගෙන තිබුණි. ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය යටතේ ප්‍රකාශකයින් නොවන අක්කර 50ට අඩු ඉඩම් හිමි පුද්ගලයින් 24 දෙනෙකු සඳහා අක්කර 462 රූඩ් 02 පර්චස් 14ක් අයත්ව තිබුණු අතර ව්‍යවස්ථාපිත නිශ්චය යටතේ පුද්ගලයින් දෙදෙනෙකුට අක්කර 91 පර්චස් 32ක් නොබෙදූ ඉඩම් වශයෙන් වෙන් කර තිබුණි. පාර්ශවයන් 46 දෙනෙකු අතරින් ප්‍රකාශකයින් නොවන පාර්ශවකරුවන් 24 දෙනෙකු වෙත රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් හාගල වතුයායෙන් හෙක්ටයාර 206ක් ලබා දීමටත්, ප්‍රකාශකයින් නොවන හිටපු අමාත්‍යවරයාගේ බිරිඳගේ ඉල්ලීම හා මණ්ඩලයේ එකඟතාවය මත ඇයට හා ඇයගේ සහෝදරයාට හන්තාන වතුයායෙන් අක්කර 45 රූඩ් 1 පර්චස් 16ක් ලබා දීමටත් රාජ්‍ය වැවිලි සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 07/SLSPC/October/2003 ට අදාල අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. (අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් විගණනයට ඉදිරිපත් නොවීය.) පසුව එම දෙදෙනාට පැවරුම් ඔප්පු දෙකක් මගින් 2003 නොවැම්බර් 13 හා 2004 ජනවාරි 19 (ඔප්පු අංක 96 හා ඔප්පු අංක 3775) යන දිනයන්හිදී මණ්ඩලයේ හිටපු සභාපතිවරයෙකු හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු විසින් අයිතිය පවරාදී තිබුණි.	අදාල පාර්ෂවයන් සඳහා රාස්සගල වතුයායෙන් හෝ වෙනත් විකල්ප ඉඩම් ලබාදෙන ලෙස ඉඩම් ප්‍රතිශංස්කරණ කොමිෂන් සභාවේ සභාපති විසින් ශ්‍රී ලංකා වැවිලි සංස්ථාවෙන් ඉල්ලීම් කර වැවිලි සංස්ථාව විසින් 7/SLSPC/ඔක්තෝබර්/2003 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට අනුමැතිය ලබාදී තිබුණු අතර පසුව මෙම ඉඩම් ලබාගැනීම සඳහා නඩු අංක 1042/98 යටතේ පාර්ෂවකරුවන් 04 දෙනෙකුට එරෙහිව නඩු පවරා ඇත. තවද නඩුව සඳහා ඉදිරිපත් කර තිබූ සමත කොන්දේසි මත හන්තාන වතුයායෙන් ඉඩම් අංක 43 රූඩ් 01 පර්චස් 16 නිදහස් කර ඇත. ඒ සඳහා වැඩිදුර තොරතුරු ලබා ගෙන සනාථ කර ගැනීමෙන් පසුව විගණන විමසුමට පිළිතුරු ලබාදීමට කටයුතු කරනු ඇත.	ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත කෘෂිකාර්මික කටයුතු සඳහා ලබාදුන් ඉඩම් බාහිර පුද්ගලයින් වෙත ලබා දීම පිළිබඳ පරීක්ෂණ පවත්වා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු කළ යුතුයි.

(ඇ)	මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව වතුයායන් විසින් උපයන ලද වෙනත් ආදායම් හැර ප්‍රධාන ආදායම් මූලාශ්‍ර වන තේ දලු විකුණුම් ආදායම,නිෂ්පාදිත තේ විකුණුම් ආදායම,වතුයාය තුළ තේ විකුණුම් ආදායම සහ රබර් කිරි විකුණීමෙන් උපයන ලද වාර්ෂික ආදායම සහ පාරිභෝජ්‍ය අංශයේ තේ විකුණුම් යන ආදායම්හි එකතුව රු.1,204,225,143 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව විකුණුම් පිරිවැය රු.1,740,151,580 ක් වී තිබුණි. ඒ අනුව මණ්ඩලයට එහි ප්‍රධාන වියදම් ඉක්මවා ආදායම් උපයා ගැනීමට නොහැකිවී තිබුණි.	මෙම විකුණුම් පිරිවැය වැඩිවීමට හේතුන් අතර ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ වතු සේවක, කම්කරු වැටුප් සාමුහික ගිවිසුම් මගින් වැඩිවීමත්, ආදායම තිරණය වන තේ මිල කොළඹ තැරුව්කරුන්ගේ වෙන්දේසියේදි තිරණය විමත්, කාරක ප්‍රාග්ධන ඌනතාවය හේතුවෙන් නිසි කෘෂිකාර්මික යෙදවුම් යෙදවිමට නොහැකි විම. වඩා හොද තත්වයේ තේ දළු ලබාගැනිමට නොහැකි විම මත තේ දළු සඳහා හොද මිලක් ලබාගැනිමට හා හොද තේ නිෂ්පාදනයක් ලබාගැනිමට නෙහැකි විමත් ආදායම අඩුවිමට හේතුවක් වී තිබේ. 2021 වර්ෂයේ කම්කරු වැටුප් වැඩිවිම හේතුවෙන් පාරිතෝෂික දීමනා වෙන් කිරිම පසුගිය වර්ෂයට සාපේක්ෂව රුපියල් මිලියන 235කින් පමණ වැඩිවී තිබේ. මෙම පාරිතෝෂික දීමනා වෙන්කිරිම් හා කම්කරු වැටුප් වැඩිවිම විකුණුම් පිරිවැය වැඩිවිමට සාපේක්ෂව බලපා ඇති අතර එය මෙහෙයුම් ක්‍රියාකාරිත්වයෙන් ප්‍රකාශ කරනු ඇත.	තේ දළු සැකසීම සඳහා හා පිරිවැය අවම කර ලාභය උපරිම කර ගැනීමට කටයුතු කළ යුතුයි.

3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මණ්ඩලයේ හා වතුයායන් වල ආදායමෙන් සියයට 0.25 ක් බැර කර විධිමත් අනුමැතියකින් තොරව "සභාපති සුභසාධක අරමුදල" නමින් අරමුදලක් 2020 වර්ෂයේදී පිහිටුවා තිබුණි. මෙම අරමුදලට සමාලෝචිත වර්ෂයේ තේ සහ රබර් ආදායමෙන් රු.1,993,624ක්ද, ජන තේ අංශයේ ආදායමෙන් රු.924,040ක්ද වශයෙන් රු.2,917,664ක් බැර කර තිබූ අතර මෙම අරමුදලින් සේවක ඇහයීම් සහ විවිධ පරිත්‍යාග සඳහා රු.4,683,175ක් සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.600,161ක ශේෂයක් ඉතිරිව තිබුණි.	මෙම බැර කිරිම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත සිදුකර ඇත. තවද මෙම අධ්‍යක්ෂ මණ්ඩලය තුළ රේඛීය අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශය නියෝග පවතින බැවින් අදාළ අනුමැතිය ලබා ඇති බව සඳහන් කරමි. ඒ අනුව විධිමත් අනුමැතියකින් තොරව මෙම අරමුදල පිහිට වූ බව සඳහන් කල නොහැකි බවත් ප්‍රකාශ කරනු ඇත.	අරමුදල පිහිටුවීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මෙන්ම භාණ්ඩාගාරයේ අනුමැතියද ලබා ගත යුතු අතර අරමුදලින් ගෙවීම් කිරීමේදී විනිවිධභාවය තහවුරු කළ යුතුය.